**7 ශ්‍රේණිය විෂය නිර්දේශය - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය**

| නිපුණතාව | නිපුණතාමට්ටම | අන්තර්ගතය | ඉගෙනුම්පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 1. පරිගණකයේ සංවිධානය හඳුනා ගනියි. | 1.1 මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) සංරචක හඳුනා ගනියි. | • මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) විවිධ ප්‍රරූප | i. අංක ගණිත හා තාර්කික ඒකකයේ (ALU) සහ පාලන ඒකකයේ (CU) කාර්යයන් විස්තර කරයි. | 01 |
| | 1.2 පරිගණකයේ පරිණාමය විස්තර කරයි. | • සකසනයේ මූලිකාංගවල (රික්ත නල, ට්‍රාන්සිස්ටර, IC යනාදියේ.) ඉතිහාසය විස්තර කරයි: ස්පන්දක වේගය, ප්‍රමාණය, උෂ්ණත්වය, බලශක්ති පරිභෝජනය මිල යනාදිය | i. මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) සංවර්ධන මං සලකුණු ලැයිස්තුගත කරයි.<br>ii. **සකසනයේ** වේග වෙනස්කම් හා වෙනත් ලක්ෂණ හඳුනා ගනියි. | 01 |
| 2. මෙමෙයුම් පද්ධතියේ කාර්ය ගවේෂණය කරයි. | 2.1 මෙහෙයුම් පද්ධති ප්‍රරූප අවබෝධ කර ගනියි. | • වින්ඩෝස්, මැක් OS, ලිනක්ස්, ඇන්ඩ්‍රොයිඩ්, ජංගම මෙහෙයුම් පද්ධති | i. විවිධ මෙහෙයුම් පද්ධති ලැයිස්තුගත කරයි.<br>ii. විවිධ උපාංගවල මෙහෙයුම් පද්ධති හඳුනා ගනියි. | 01 |
| | 2.2 විවිධ මාධ්‍යවල සංඛ්‍යාංක දත්ත එකතුවක් ලෙස පරිගණක ආචයනය හඳුනා ගනියි. | • සැණ ධාවකය (Flash Drive),දෘඪ ධාවකය (Hard Drive), සංගත තැටි (CD), සංඛ්‍යාංක බහුවිධි තැටි( DVD ) | i. සැණ ධාවකය (Flash Drive), දෘඪ ධාවකය (Hard Drive), සංගත තැටි (CD), සංඛ්‍යාංක බහුවිධි තැටි ( DVD ) ආදියෙහි භාවිතය විස්තර කරයි. | 01 |
| | 2.3 ගොනු බහාලුම් නිර්මාණය කරයි/ ගොනු සුරකියි / විවෘත කරයි / සංස්කරණය කරයි / ඉවත් කරයි / නැවත නම් කරයි / පිටපත් කරයි / විතැන් කරයි. | • ගොනු බහාලුම් සහ ගොනු මෙහෙයවීම<br>○ ආචයනයක සිට ආචයනයක ට ගොනු විතැන් කිරීම හා පිටපත් කිරීම | i. ගොනු බහාලුම් වල ඇති ගොනු විවෘත කර සුරක්ෂිත කරයි.<br>ii. කාර්යයන් අනුව ගොනු සංවිධානය කරයි. | 02 |
| | 2.4 ගොනු ගුණාංග ගවේෂණය කරයි. | • ප්‍රමාණය, වර්ගය, වෙනස් කළ දිනය හඳුනා ගැනීම | i. ගොනුවල ගුණාංග ලැයිස්තුගත කරයි.<br>ii. ගොනුවල ගුණාංග පැහැදිලි කරයි. | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 3. පරිගණක විද්‍යාගාරය තුළ විවිධ පූර්වාරක්ෂණ ක්‍රම භාවිත කරයි. | 3.1 පරිගණකයක භෞතික සංරචක ආරක්ෂා කර ගැනීමට සඳහා විවිධ පූර්වාරක්ෂණ විධි ක්‍රම භාවිත කරයි. | • සර්ජන ආරක්ෂණය සහ වෝල්ටීයතා බිඳ වැටීම්වලට එරෙහිව ආරක්ෂාව සැපයීම ( Fuses හා UPS)<br>• භෞතික හානිවලට එරෙහිව ආරක්ෂාව (දූවිලි, ආර්ද්‍රතාව, කෘමීන් … ආදිය)<br>• පරිගණකය ඇතුළත අධික ලෙස රත්වීමට එරෙහිව ආරක්ෂාව | i. දෘඪාංග ආරක්ෂක ගැටලු හඳුනා ගනියි.<br>ii. දෘඪාංග සංරචකවලට සිදුවන අවදානම අවම කර ගැනීමට පූර්වාරක්ෂා පියවර ගනියි. | 01 |
| | 3.2 පරිගණක මෘදුකාංග සංරචක ආරක්ෂා කිරීමට විවිධ පූර්වාරක්ෂණ විධි ක්‍රම භාවිත කරයි. | • අනිෂ්ට මෘදුකාංගවලට (malware) විරුද්ධව ප්‍රතිවයිරස මෘදුකාංග භාවිතය හා වෙනත් පියවර<br>• ප්‍රවේශ පාලන (භෞතික අගුලු සහ මුරපද) | i. මෘදුකාංග ආරක්ෂක ගැටලු හඳුනා ගනියි.<br>ii. මෘදුකාංග හානි අවම කිරීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂා පියවර ගනියි. | |
| 4. එදිනෙදා කටයුතු සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි | 4.1 යතුරුලියනය කිරීමේ කුසලතාව වර්ධනය කරයි. | • යතුරුලියනය කිරීමේ නිසි තාක්ෂණික ක්‍රම භාවිත කිරීම(ස්පර්ශ යතුරුකරණය)<br>• යතුරුලියනය කිරීමේ කුසලතාව වර්ධනය කිරීම සඳහා යතුරුලියනය කිරීමේ මෘදුකාංග භාවිත කිරීම | i. ඉංග්‍රිසි යතුරුලියන කුසලතා වර්ධනය කර ගනියි.<br>ii. සිංහල/ දෙමළ යතුරුලියන කුසලතා වර්ධනය කර ගනියි. | 01 |
| 5. සරල ක්‍රමලේඛ සංවර්ධනය කරයි (**scratch** භාවිතය) | 5.1 තර්කානුකූලව සම්බන්ධ කිරීම් සහ වියෝජනයෙන් (Decomposing) සරල ගැටලු විශ්ලේෂණය කරයි. | • ගැලීම් සටහන් භාවිතය<br>○ අනුක්‍රමය<br>○ තේරීම (තේරීමේ සංකල්පය)<br>○ පුනර්කරණය (පුනර්කරණයේ සංකල්පය) | i. විවේචනාත්මක සහ විශ්ලේෂණාත්මක චින්තන ක්‍රම ආදර්ශනය කරයි.<br>ii. ගැලීම් සටහන්වල අනුක්‍රමය විස්තර කරයි.<br>iii. ඒවායේ යෝග්‍ය භාවිතයන් ආදර්ශනය කරයි. | 02 |
| | 5.2 දෘශ්‍ය සංවර්ධන පරිසරය භාවිත කරමින් සරල වැඩසටහන් සංවර්ධනය කරයි. (Scratch භාවිතයෙන්) | • පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය කිරීම සඳහා අන්තර් ක්‍රියයාකාරි සංවර්ධන පරිසරය (IDE) හැඳින්වීම<br>• ක්‍රමලේඛන භාෂාවක් ආධාරයෙන් (අතුරුමුහුණත් භාවිතයෙන්) විශේෂ සරල ක්‍රමලේඛ (අනුක්‍රමය අඩංගු) සිසුන්ට ඉගැන්වීම නිර්මාණය | i. Scratch ක්‍රමලේඛන/ වැඩසටහන් අන්තර් ක්‍රියාකාරි සංවර්ධන පරිසරය (IDE) යොදා ගනියි.<br>ii. සරල වැඩසටහන් සංවර්ධනය කිරීමට මූලික අනුක්‍රමික පාලනයන් භාවිත කරයි. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| | 5.3 සරල ක්‍රමලේඛයක ඇති විචල්‍යය සංකල්පය පැහැදිලි කරයි. | • විචල්‍යය අර්ථ දැක්වීම<br>• ක්‍රමලේඛවල විචල්‍යයන් භාවිත කිරීම | i. ක්‍රමලේඛවල විචල්‍යයන් භාවිත කිරීම විස්තර කරයි.<br>ii. සුදුසු පරිදි විචල්‍යයන් සමඟ ක්‍රමලේඛ ලියයි. | 02 |
| | 5.4 ක්‍රමලේඛයෙක දෝෂ සංකල්පය Bugs ලෙස හඳුනා ගනියි. | • දෝෂ සහිත ක්‍රමලේඛ දෝෂ රහිත කිරීම හඳුන්වාදීම සහ ප්‍රතිදානය නිරීක්ෂණය | i. ක්‍රමලේඛයන්ගේ දෝෂවල බලපෑම සහ දෝෂ වැළැක්වීමට ගත හැකි පූර්වාරක්ෂාවන් විස්තර කරයි. | 01 |
| 6. සමර්පණ මෘදුකාංග භාවිතයෙන් සමර්පණයක් නිර්මාණය කරයි. | 6.1 සමර්පණයක් නිර්මාණය කිරීම සඳහා සමර්පණ මෘදුකාංගයේ මූලික ක්‍රියාවන් භාවිත කරයි. | • සමර්පණයක් නිර්මාණය, විවෘත කිරීම, ගබඩා කිරීම, සහ වැසීම<br>• කදා එක් කිරීම<br>• පාඨ, පින්තූර, හැඩ,clip art, word art, …..ආදී ගොනුවක්/ වස්තුවක් ඇතුළත් කිරීම<br>• පාඨ හැඩසව් කිරීම<br>• කදාවකට බහු මාධ්‍ය හා වගු ඇතුළත් කිරීම<br>• කදා පිරි සැලසුම<br>• කදා විතැන් කිරීම (move), පිටපත් කිරීම (Duplicate), සැඟවීම, මැකීම<br>• කදා සංක්‍රමණය (Slide transition) | i. සමර්පණ මෘදුකාංග භාවිතයෙන් සමර්පණයක් නිර්මාණය කරයි. | 05 |
| 7. තොරතුරු හා සන්නිවේදන අරමුණු සඳහා අන්තර්ජාලය භාවිත කරයි. | 7.1 අන්තර්ජාලයේ තිබිය හැකි (පාඨ, චිත්‍රක, ශබ්ද, දෘෂ්‍යක ... ආදි) සම්පත් භාවිත කරයි. | • විශ්ව විසිරි වියමන (WWW), ඒකාකාරි සම්පත් නිශ්චායකය (URL), පාඨ, චිත්‍රක, දෘශ්‍යක ආදිය බාගත කිරීම(download)<br>• පෘථිවි සිතියම් ප්‍රවේශය<br>• විශ්වාසනීය හා විශ්වාසනීය නොවන වෙබ් අඩවි<br>• සත්‍ය හා විශ්වාසනීය තොරතුරු | i. තොරතුරු එක් රැස් කිරීම සඳහා අන්තර්ජාලය භාවිතා කරයි.<br>ii. විශ්වාසනීය හා විශ්වාසනීය නොවන වෙබ් අඩවි හඳුනා ගනියි.<br>iii. සත්‍ය හා විශ්වාසනීය තොරතුරු හඳුනා ගනියි. | 01 |
| | 7.2 මාර්ගඅපගත (E-mail) සහ මාර්ගගත (Chat) සන්නිවේදනයන් භාවිත කරයි. | • වෙබ් අඩවි පාදක වූ නිදහස් විද්‍යුත් තැපැල (E-mail)<br>• ගිණුම් නිර්මාණය කිරීම | i. විද්‍යුත් තැපැල හරහා සන්නිවේදනය කරයි<br>ii. මාර්ගගත සම්මන්ත්‍රණ හරහා සන්නිවේදනය කරයි | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | | • විද්‍යුත් තැපැල භාවිතය: විෂයය, ලබන්නා, පිටපත, රහස් පිටපත, ඇමුණුම්, ඉදිරියට යැවීම (Forward), එවන ලද ලිපි, යවන ලද ලිපි, යැවීම සඳහා සකස් කරන ලද එහෙත් නොයැවූ ලිපි, මකා දමන ලද ලිපි, ආයාචිත තැපැල, පිළිතුරු යැවීම<br>• මාර්ගගත සම්මන්ත්‍රණ | | |
| | 7.3 HTML භාවිතයෙන් වෙබ් පිටු සංවර්ධනය කරයි. | • පාඨ, රූප භාවිතයෙන් වෙබ් පිටුවක් නිර්මාණය කිරීම<br>○ පාඨ හැඩ සව් කිරීම<br>○ වර්ණ<br>○ ලැයිස්තු<br>• වෙබ් පිටු (බාහිර අඩවි/ ගොනු) සම්බන්ධ කිරීම | i. සරල වෙබ් අඩවියක් සැලසුම් කරයි<br>ii. සරල වෙබ් අඩවියක් නිර්මාණය කරයි | 02 |
| | 7.4 සුරක්ෂිතව, පරිස්සම් සහිතව හා සදාචාරාත්මකව අන්තර්ජාලය භාවිත කරයි. | • අනවසර පිවිසුම්වලට හා අනිෂ්ට මෘදුකාංගවලට (malware) එරෙහි ව ආරක්ෂාව<br>○ අනවසරයෙන් ඇතුලු වීම (Hacking)<br>○ වයිරස ප්‍රහාර<br>○ මෘදුකාංග කොල්ලකෑම් (software piracy)<br>○ සදාචාරාත්මකව අන්තර්ජාලය භාවිතය<br>○ සයිබර් හිරිහැර කිරීම (cyber bullying)<br>○ අන් අයගේ දත්ත සොරකම් කිරීම (stealing others data )<br>• නාඳුනන පාර්ශ්වයන්ට එරෙහිව මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පෙර පරිස්සම | i. සුපරික්ෂාකාරීව අන්තර්ජාලය භාවිත කරයි.<br>ii. ආරක්ෂිතව අන්තර්ජාලය භාවිත කරයි.<br>iii. ආචාරශීලීව අන්තර්ජාලය භාවිත කරයි. | 02 |
| | | | එකතුව | 30 |